රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 1/98(1)

මගේ අංකය : ආ/III/2/1-3
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1999 සැප්. 08 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුදමය වාතාවරණය හා යුධ මෙහෙයුම්**
**හේතුවෙන් අවතැන් වී සේවයට වාර්තා කිරීමට නොහැකි වන**
**රාජ්‍ය නිලධාරීන්ට විශේෂ නිවාඩු**

උක්ත මැයෙන් වු 1998.01.23 දිනැති අංක 1/98 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 12:14 උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

12:14 " අනුමත කරන ලද නිවාඩු පිට, තම සේවා ස්ථානයෙන් බැහැරව ගොස් සිටින කිසියම් නිලධාරියෙකුට, රජයේ ආරක්ෂක හමුදා විසින් කරනු ලබන යුද මෙහෙයුම් නිසා එම නිවාඩුව අවසානයේ තම සේවා ස්ථාන වලට සේවය සඳහා නියමිත දිනට වාර්තා කිරීමට නොහැකිවන අවස්ථා වලදී මෙම වගන්තිය යටතේ විශේෂ නිවාඩු ලබා දිය හැකිය.මෙම නිවාඩු අනුමත කිරීමට පෙර නිවාඩු අනුමත කරන නිලධාරියා විසින් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති විමසා උක්ත ප්‍රදේශශවල එම තත්ත්වය පිළිබඳ සත්‍යතාවය සහතික කරවා ගත යුතුය. එසේ වුවද යම් අවිනිශ්චිත තත්ත්වයක් පැන නැගුනහොත් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විමසිය යුතුය".

02. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1999.04.01 දින සිට බල පැවැත්වේ.

**(පී.ඒ. සේනාරත්න)**
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.